# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2446/31 – 2025 ජූලි මස 21 වැනි සඳුදා – 2025.07.21**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2024/63.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

ජී. ඒ. පී. දේශප්‍රිය මහතා,
අංක 24/A/11,
පළමු පටුමඟ,
විවේකාරාම පාර,
කිරිවත්තුඩුව.

සහ

1. සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව,
   අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

2. මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ්,
   රක්ෂණ මන්දිරය, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

3. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්
රක්ෂණ මන්දිරය, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

4. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්,
රක්ෂණ මන්දිරය, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡෙදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කොළඹ 04, බම්බලපිටිය, ගාලු පාර, 411/16, නිතිඥ ආර්. නවෝදයම් මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 11 වැනි දින.
කොළඹ දී ය.

මගේ අංකය : IR/COM/03/2024/63.

**ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ජී. ඒ. පී. දේශප්‍රිය මහතා,
අංක 24/A/11,
පළමු පටුමඟ,
විවේකාරාම පාර,
කිරිවත්තුඩුව.

සහ

1. සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව,
අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

2. මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ්,
රක්ෂණ මන්දිරය, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

3. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්,
රක්ෂණ මන්දිරය, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

4. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්,
රක්ෂණ මන්දිරය, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ

"මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ්හි පත්වීම් ලබා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ තනතුරු කිහිපයක සේවයේ නියුතුව සිටි ජී. ඒ. පී. දේශප්‍රිය මහතාට පහත සේවා තත්ත්වයන් හා කොන්දේසි මගින් අසාධාරණයක් සිදු වී තිබේද යන්නත් එසේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්නත් වේ.

I. 2016.10.04 දින සිට ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරට අදාළව වැඩ බැලීමේ දීමනා නොගෙවීම

II. නිසි කාර්ය සාධනයක් සිදු නොකර පරිවාස කාලය මාස 6 කින් දීර්ඝ කිරීම

III. ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර ලබා නොදී ඔහුගේ ක්ෂේත්‍රයට අදාළ නොවන සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන හා දේපළ කළමනාකරණ) තනතුරට පත් කිරීම/උසස් කිරීම

IV. 2021.03.15 දින සිට ජී. ඒ. පී. දේශප්‍රිය මහතාට අදාළ නොවන, දැනුමක් සහ පළපුරුද්දක් නොමැති විකුණුම් අංශයේ සහකාර සාමාන්‍යාධිකාරී (විශේෂ ව්‍යාපෘති) තනතුරට පත් කිරීම සහ තනතුරට අදාළ කාර්යයන් සිදු කරවා ගැනීමට අවශ්‍ය සේවකයන් හා පහසුකම් ලබා නොදිම

V. 2021.12.09 දින ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරට පත්කර එම තනතුරේ සුපරීක්ෂණ කාල සීමාවට අදාළව සිදු කරනු ලැබූ කාර්ය සාධනය ඇගයීමේදී 86.3% ක අගයක් ලබා තිබියදීත් 2022.10.27 දින සිට නැවත පෙර සිටි තනතුරට පත් කිරීම.”

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජුනි මස 30 දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

EOG 07 - 0251

---

මගේ අංකය : IR/COM/03/2023/19.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

සුපුන් සචින්ත කන්නන්ගර මහතා,
අංක 55/M/5,
කහන්තොට පාර,
මාලඹේ.

සහ

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 933,
නුවර පාර,
වෙදමුල්ල,
කැළණිය.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත

අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කළුතර, නාගොඩ, ශ්‍රී සෝභිත මාවත, අංක 242 නීතිඥ ඕබඩගේ ලීලාරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 11 වැනි දින.
කොළඹ දී ය.

මගේ අංකය : IR/COM/03/2023/19.

**ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

සුපුන් සචින්ත කන්නන්ගර මහතා,
අංක 55/M/5,
කහන්තොට පාර,
මාලඹේ

සහ

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 933,
නුවර පාර,
වෙදමුල්ල,
කැළණිය.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ

"2019.03.27 දිනැති ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අර්පණ ලිපිය මගින් ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවේ සිට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත අන්තර්ග්‍රහණය කරනු ලැබූ සුපුන් සචින්ත කන්නන්ගර මහතාට 2022.02.22 දිනැති මානව සම්පත් හා පාරිශ්‍රමික අනු කමිටු පත්‍රිකා නිර්නායක පදනම් කර ගනිමින් නිලධාරී IV තනතුරේ සිට නිලධාරී III තනතුරට උසස් වීම සඳහා වසර පහක සේවා කාලයක් සම්පූර්ණ කළයුතු බව සඳහන් කිරීම මගින් අසාධාරණයක් සිදු වී තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඔහුට හිමි විය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ."

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජුනි මස 20 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

EOG 07 - 0252

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.